කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි

තෙවන පරීක්ෂණය (බාහිර) - 2008

# BMGT 33035 – සමස්ත තත්ත්ව කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 07

කාලය : පැය 03 යි

උපදෙස්:
1) පළමු කොටස අනිවාර්යයි.
2) දෙවන කොටසෙන් ප්‍රශ්න තුනකට (03) කට පිළිතුරු සපයන්න

පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 04යි.

## 1 වන කොටස

1)

I තත්ත්වය/ ගුණත්වය පිළිබඳ ඩෙමින්ගේ මූලධර්ම කවරේද?

II තත්ත්වය පිළිබඳ කෙටි සටහනක් ලියන්න

III ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය (නැවත සැලසුම්කරණය) නිර්වචනය කරන්න

IV ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ ප්‍රයෝජන මොනවාද ?

V අවශ්‍ය විට මිලට ගැනීමේ ක්‍රමය (Just in Time (JIT)). පිළිබඳ කෙටි සටහනක් ලියන්න

VI සමස්ත තත්ත්ව කළමනාකරණයට ඇති බාධා ලැයිස්තු ගත කරන්න

VII කයිසන් යනු කුමක්ද ?

VIII ඉහළ මට්ටමක තත්ත්වයකින් යුක්ත සංවිධානයක් ගොඩනැගීම සඳහා සේවක සහභාගිත්වය වැදගත්වන්නේ ඇයි?

IX තත්ත්ව පාලනය පිළිබඳ කෙටි සටහනක් ලියන්න

X අභ්‍යන්තර සහ බාහිර ගණුදෙනුකරුවා පිළිබඳ කෙටිසටහනක් ලියන්න

(එකකට ලකුණු 04 බැගින්)
(මුළු ලකුණු 40)

## 2 වන කොටස

2) a) ව්‍යාපාර සංවිධානයන්ට සමස්ත තත්ත්ව කළමනාකරණයේ අවශ්‍යතාවය හා වැදගත්කම සාකච්ඡා කරන්න

(ලකුණු 10)

b) පහත සඳහන් කරුණු භාණ්ඩයක තත්ත්වයට බලපාන ආකාරය විස්තර කරන්න

(a) අවශ්‍ය විට මිලදීගෙන නිෂ්පාදනය (Just –in- time manufacturing (JIT) )

(b) වැලකුම් නඩත්තුව (Preventive maintenance )

(ලකුණු 10)

*(මුළු ලකුණු 20)*

3) (a) පිල් මලු ක්‍රමය භාවිතය සම්බන්ධයෙන් පවත්නා (හරාකරණය) ("Benchmarking") සීමාවන් මොනවාද ?

(ලකුණු 10)

(b) පිල් මලු වැඩසටහනක් ("Benchmarking Program") ස්ථාපිත කිරීමේදි අනුගමනය කළ යුතු පියවරයන් පැහැදිලි කරන්න

(ලකුණු 10)

*(මුළු ලකුණු 20)*

4) a) සමස්ත තත්ත්ව කළමනාකරණයේ මානවවාදි මූලිකාංග මොනවාද? විස්තර කරන්න

(ලකුණු 10)

b) "තත්ත්වයේ මූලික අරමුණ වන්නේ පාරිභෝගිකයාට වටිනාකමක් ලබාදීමයි."
මෙම ප්‍රකාශය ඇගයීමට ලක්කර පාරිභෝගිකයාට වැඩි වටිනාකමක් ලබාදීමට සමාගමකට උපයෝගි කර ගත හැකි ක්‍රම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

*(මුළු ලකුණු 20)*

5) (a) සමස්ත තත්ත්ව කළමනාකරණය සංවිධානයක් තුල ක්‍රියාත්මක කිරීමේදි එය අසාර්ථක වීමට තුඩු දෙනු ලබන හේතු දක්වන්න. ඔබ සිතන අයුරින් එයට වගකිව යුත්තේ කවුරුන්ද යන්නත් විස්තර කරන්න

(ලකුණු 10)

(b) සමස්ත තත්ත්ව කළමනාකරණය ජනප්‍රියවීමට හේතු මොනවාද යන්න සාකච්ඡා කර එය ශ්‍රී ලංකාව සැලකිල්ලට ගනිමින් අගයන්න.

(ලකුණු 10)

*(මුළු ලකුණු 20)*

6) a) ඔබගේ අදහස අනුව දෙවන ලෝක යුද්දයේ සිට කුමන තත්ත්ව ගුරුවරුන්ගේ අදහස් තත්ත්ව කළමනාකරණයට වඩා බලපෑම්කරන ලද්දේද? මෙම තත්ත්ව ගුරුවරුන්ගෙන් එක් අයෙකු තෝරාගෙන ඔහුගේ දායකත්වය කෙටියෙන් විස්තර කරන්න

(ලකුණු 10)

b) මෙම ප්‍රකාශය කෙටියෙන් විස්තර කරන්න "තත්ත්වය පළදායිතා යාන්ත්‍රනය මෙහෙයවයි."

(ලකුණු 10)

*(මුළු ලකුණු 20)*

7) පහත සඳහන් මාතෘකා අතුරින් මාතෘකා හතරක් පිළිබඳ කෙටි සටහන් ලියන්න

(a) පැරටෝ සටහන (Pereto Diagram)

(b) තත්ත්ව පිරිවැය

(c) සික්ස් සිග්මා (Six Sigma)

(d) ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සම්මානය

(e) 5 S ක්‍රමය

(f) සේවා තත්ත්ව ඉතිමග

(එක් මාතෘකාවට ලකුණු 05 බැගින් මුළු ලකුණු 20)